“නුඹලා කද්ර් රාත්රිය රමළාන් මාසයේ අවසන් දින දහයේ ඔත්තේ දිනයන්හි සොයන්න

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: “නුඹලා කද්ර් රාත්රිය රමළාන් මාසයේ
අවසන් දින දහයේ ඔත්තේ දිනයන්හි සොයන්න" [صحيح] [متفق عليه]

අධික ලෙස නැමදුම්වල නිරත වනු පිණිස ලයිලතුල් කද්ර් හෙවත් බලගතු රාත්රිය සෙවීම, ඒ ගැන විමසිල්ලෙන් සිටීම එය ලබන්නට කැපවීම සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දිරි ගන්වා ඇත. එය බොහෝ දුරට සෑම වසරකම රමළාන් මාසයේ අවසන් දින දහයේ ඔත්තේ දිනයන්හි පිහිටනු ඇත. එනම්: විසි එක, විසි තුන, විසි පහ, විසි හත, සහ විස නව යන දිනයන් වේ.

https://sunnah.global/hadeeth/si/show/4540